www.agaram.lk

# NALANDA VIDYALAYA නාලන්දා විද්‍යාලය - කොළඹ 10

දෙවන වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

**10 ශ්‍රේණිය** | **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය** | **ඒකකය 01 : ව්‍යාපාර පසුබිම**

- **පහත ප්‍රශ්න අංක 01 සිට 12 දක්වා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුරු තෝරන්න.**

01) භාණ්ඩ හුවමාරු ක්‍රමයේ පදනම වනුයේ,
1) ඍජු නිෂ්පාදනයයි 2) වක්‍ර නිෂ්පාදනයයි
3) අතිරික්ත නිෂ්පාදනයයි 4) බාටාර් ක්‍රමයයි

02) ව්‍යාපාරය යන්නට වඩාත් නිවැරදි නිර්වචනය වනුයේ,
1) භාණ්ඩ අලෙවිකරණ වෙළෙඳසැලකි
2) භාණ්ඩ හා සේවා අලෙවිකරණ භෞතික ස්ථානයකි
3) මිනිස් අවශ්‍යතා සහ වුවමනා තෘප්තිමත් කරන ඕනෑම ආර්ථික කටයුත්තකි
4) භාණ්ඩ හා සේවා අලෙවි කරන වෙබ් අඩවියක් වේ.

03) වර්තමාන ලෝකයට විශ්ව ගම්මානයක් බවට පත්වීමට බලපෑ හේතුව වනුයේ,
1) ජංගම දුරකථන ක්ෂේත්‍රයේ සිදු වූ වර්ධනයයි.
2) ප්‍රවාහන ක්ෂේත්‍රයේ සිදු වූ වර්ධනයයි.
3) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වේගවත් වර්ධනයයි.
4) ව්‍යාපාරික ක්ෂේත්‍රයේ සීඝ්‍ර දියුණුවයි.

04) ව්‍යාපාරික උප අරමුණක් වන "රැකියා උත්පාදනය" , ව්‍යාපාරයට වැදගත් වනුයේ,
1) සමාජ සුභ සාධන කාර්යයක් ඉටු කිරීමක් ලෙසය.
2) පුද්ගලයන්ගේ විවිධ දක්ෂතා ව්‍යාපාරයේ ප්‍රයෝජනයට ගැනීමටය.
3) සේවක සුභසාධනය සඳහාය.
4) සේවා වියුක්තිය අවම කිරීම සඳහාය.

05) ව්‍යාපාරයක් විසින් ඉටු කරන සේවක සුභ සාධන කටුත්තක් නොවන්නේ,
1) නිල ඇඳුම් ලබාදීම 2) අහාර ලබාදීම
3) රැකියා ලබාදීම 4) ප්‍රවාහන පහසුකම් ලබාදීම

06) මූලික මිනිස් අවශ්‍යතා පමණක් දැක්වෙන පිළිතුරු තෝරන්න.
1) ඇඳුම්, සෞඛ්‍යය, නිවාස 2) ආහාර, ඇඳුම්, නිවාස
3) නිවාස, සෞඛ්‍යය, ආරක්ෂාව 4) ආහාර, ආරක්ෂාව, ඇඳුම්

07) සමාජීය මිනිස් අවශ්‍යතාවයකි,
1) ආහාර 2) අධ්‍යාපනය 3) නිවාස 4) ඇඳුම්

08) සේවා සැපයීමේ ව්‍යාපාරයක් සඳහා නිදසුනක් වනුයේ,
1) සකස් කළ ආහාරපාන නිපදවන ආයතනය
2) සිල්ලර වෙළෙඳ ආයතනය
3) මෝටර් රථ නිෂ්පාදන ආයතනය
4) ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතන

Agaram.LK - Keep your dreams alive!



agaram.lk

09) නිෂ්පාදන සාධක ඇතුළත් නිවැරදි පිළිතුරු වනුයේ,
1) භූමිය, ව්‍යවසාය, සංවිධායකයා, ශ්‍රමය
2) සංවිධායකයා, භූමිය, අයිතිකරුවන්, ප්‍රාග්ධනය
3) ව්‍යවසාය, ප්‍රාග්ධනය, අයිතිකරුවන්, භූමිය
4) ප්‍රාග්ධනය, ශ්‍රමය, ව්‍යවසාය, භූමිය

10) සේවාවල ලක්ෂණයක් නොවන්නේ,
1) ගබඩා කළ හැකි වීම
2) සපයන්නා අනුව ගුණත්වය වෙනස් වීම
3) අදෘෂ්‍යමය වීම
4) එක් වරක් භාවිතා කළ පසු අහෝසි වීම

11) "X" තීරුවේ නිෂ්පාදන සාධක ද "Y" තීරුවේ එම සාධකවලට අදාළ ප්‍රකාශ කිහිපයක් ද දක්වේ.

| X | Y |
|---|---|
| 1) භූමිය | A – මිනිසා විසින් නිපදවයි. |
| 2) ශ්‍රමය | B – නව්‍යතා සම්පාදනය කරයි. |
| 3) ප්‍රාග්ධනය | C – සීමිත සැපයුමක් සහිත වේ. |
| 4) ව්‍යවසාය | D – සජීවී නිෂ්පාදන සාධකයකි |

ඉහත "X" හා "Y" තීරුවේ ප්‍රකාශ අනුපිළිවෙල ගැලපූ විට ලැබෙන පිළිතුර වනුයේ,
i) A, B, C හා D වේ
ii) C, D, A හා B වේ
iii) C, D, B හා A වේ
iv) D, A, C හා B වේ

- **පහත සඳහන් ''අ'' තීරුවේ ඇල්මැති පාර්ශ්වයක් ද ''ආ'' තීරුවේක ඒ එක් එක් පාර්ශ්වයන්ට අදාළ අරමුණු ද වේ.**

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1) අයිතිකරුවෝ | A – දෙන ලද ණය අයකර ගැනීම |
| 2) ණයදෙනුකරුවෝ | B – රැකියා අවස්ථා උත්පාදනය කිරීම |
| 3) මූල්‍ය ආයතන | C – ආයෝජන සුරක්ෂිතතාවය |
| 4) රජය | D – නිෂ්පාදන සාධාරණ මිලට ලබා ගැනීම |

12) ඉහත ''අ'' හි පිළිවෙලට ''ආ'' ගැලපු විට නිවැරදි පිළිතුර වනුයේ,
i) B, C, A හා D වේ
ii) C, D, B හා A වේ
iii) C, D, A හා B වේ
iv) A, D, B හා C වේ

- **ප්‍රශ්න අංක 13 සිට 18 දක්වා පහත සඳහන් ප්‍රකාශ අසත්‍ය නම් X සත්‍ය නම් ✔ ලකුණ ද යොදන්න.**

13) පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම ලාභ අපේක්ෂිත ව්‍යාපාරයක අරමුණ වේ. (    )
14) අවශ්‍යතා පුද්ගලයාගේන් පුද්ගලයාට විවිධ වේ. (    )
15) අවශ්‍යතා සපුරාගන්නා විවිධ ආකාර වුවමනා නම් වේ. (    )
16) ආරක්ෂාව යනු මූලික මිනිස් අවශ්‍යතාවයකි (    )
17) අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා ලබාදෙනු ලබන ක්‍රියාවක් හෝ ක්‍රියාවලියක් සේවා නම් වේ. (    )
18) ව්‍යාපාර සඳහා යොදන කායික හා මානසික දායකත්වය ශ්‍රමය ලෙස හැඳින්වේ. (    )

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

- **පහත සඳහන් ප්‍රශ්න අංක 19 සිට 23 දක්වා නිවැරදි යෙදුම් භාවිතා කරමින් හිස්තැන් පුරවන්න.**


19) භාණ්ඩ හා සේවා නිෂ්පාදය කිරීම සඳහා අවශ්‍ය සම්පත් ................................... ලෙස හැඳින්වේ.

20) නිවැරදි තීරණ ගැනීම, සැලසුම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම, ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශ්වයක් වන ................................... විසින් සිදු කරයි.

21) සාධාරණ වැටුපක් ලබා ගැනීම, රැකියා සුරක්ෂිත බව ඇති කර ගැනීම ආදී අරමුණු සහිත ඇල්මැති පාර්ශවය වන්නේ ................................... ය.

22) භෞතික පැවැත්මක් තිබීම, ස්පර්ෂ කළ හැකි වීම ................................... ක ලක්ෂණය වේ.

23) නිෂ්පාදන සාධක පිළිබඳ පහත රූපසටහනයට අදාළ නිවැරදි යෙදුම් භාවිතා කරමින් හිස්තැන් පුරවන්න.




i) A -........................................ ii) B -........................................

iii) C -........................................ iv) D -........................................

- **පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද ලියා ලියා දක්වන්න.**

24) පාරිභෝගික රුචිකත්වය, ආදායම් මට්ටම, සමාජ තත්ත්වය ආදිය කරුණු මත පාරිභෝගිකයන් විවිධ සන්නම් නාම (Brand Name) යටතේ භාණ්ඩ තෝරා ගනියි. ......................

25) "ව්‍යාපාර සඳහා හිතකර දිරිගැන්වීම් ලබාදීම" ව්‍යාපාරයක් රජයෙන් අපේක්ෂා කරන දායකත්වකි .....................

## II කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01) බාටර් ක්‍රමය යනුවෙන් හැඳින්වෙනුයේ කුමක්ද?

02) මිනිස් අවශ්‍යතා යනුවෙන් හැඳින්වෙනුයේ කුමක්ද? උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

03) මිනිස් අවශ්‍යතාවල ලක්ෂණ 03 ක් ලියන්න.

04) මිනිස් වුවමනා යනු මොනවාද? උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

05) භාණ්ඩ හා සේවා අතර වෙනස පැහැදිලි කර වෙනස්කම් ලියා දක්වන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk

- **පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**වාණිජ අංශයේ උසස් පෙළ** හැදෑරූ සුදම් රු. 200,000/- ක මුදල් යොදා **"සුදම් ෆුඩ්ස්"** නමින් දේශීය ආහාර සකස් කර විකිණීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. එහි ආහාර සැකසීම සඳහා පළපුරුදු දක්ෂ සූපවේදියෙකු වූ දමිත් සේවයට බඳවා ගන්නා ලදි.

06) නිෂ්පාදිතයේ ස්වභාවය අනුව මෙම ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර වර්ගය කුමක්ද?

07) මෙම සිද්ධියේ සඳහන් **"සුදම් ෆුඩ්ස්"** ආයතනය මඟින් සපුරාලනු ලබන,

i) මූලික මිනිස් අවශ්‍යතාවය කුමක්ද?

ii) වුවමනාව කුමක්ද?

08) සුදම්ගේ ව්‍යාපාරය භාවිතා කරන නිෂ්පාදන සාධක උදාහරණ සමඟ දක්වන්න.

09) සුදම් ෆුඩ්ස් ආයතනය සතු ශක්තීන් මොනවාද?

10) සුදම් ෆුඩ්ස් ආයතනයට සම්බන්ධ ඇල්මැති පාර්ශ්ව මෙම සිද්ධිය ඇසුරෙන් ලියා දක්වන්න.

agaram.lk

සැකසුම = බී.එස්. ඉමේෂා ලක්ෂ්මන්

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



agaram.lk